(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3(9).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 මාර්තු 20 සිකුරාදා**

---

**2026 අප්‍රේල් 07 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

බේරාගැනීම, පුනරුත්ථාපනය සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— යුද්ධ හමුදා පනත යටතේ නියෝග,— (357 අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— නාවික හමුදා පනත යටතේ නියෝග,— (358 අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ගුවන් හමුදා පනත යටතේ නියෝග,— (359 අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 සහ 155 වගන්ති යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 15 දිනැති අංක 2423/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ රීති,— 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1)(ඇ) වගන්තිය සහ VI වන කොටස සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2026 ජනවාරි 30 දිනැති අංක 2473/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියෝගය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 4ඊ වගන්තිය සමඟ කියවිය යුතු 3 වගන්තිය යටතේ සුදුසුකම් නිර්ණායක සහ බදු නිදහස් කිරීම් හෝ බදු දිරි ගැන්වීම් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 පෙබරවාරි 08 දිනැති අංක 2474/66 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව 2026 සම්බන්ධයෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2026 අප්‍රේල් 07 අඟහරුවාදා)**

1849/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ණය සහනදායක ආඥාපනත සහ එහි කාර්ය පටිපාටිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ 2025.07.15 දිනැති වාර්තාව ලැබී තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම කමිටු වාර්තාවේ සඳහන් ප්‍රධාන නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ අනුව මේ වනවිට සිදු කර ඇති පරිපාලන වෙනස්කම් කවරේද;

(v) කමිටු වාර්තාවේ නිර්දේශ අනුව සිදු කිරීමට අපේක්ෂිත නීතිමය සංශෝධන කවරේද;

(vi) එම සංශෝධන සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ණය සහනදායක මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ණය සහනදායක මණ්ඩලයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව කොපමණද;

(iv) 2026 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලය වෙනුවෙන් රජය විසින් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1865/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම් සහතික ලබා දීම ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) මේ දක්වා එම පනත යටතේ ලබාදී ඇති හිමිකම් සහතික ප්‍රමාණය කොපමණද;

(iii) ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ නීතිමය තත්ත්වය යාවත්කාලීන කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, යෝජිත නීතිමය ප්‍රතිසංස්කරණ කවරේද;

(iii) එම නීතිමය ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1866/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ‘Clean Sri Lanka’ ජනාධිපති කාර්යසාධක බලකායේ වර්තමාන සාමාජිකයන් කවුරුන්ද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ මෙතෙක් ක්‍රියාත්මක කොට අවසන් කරන ලද ව්‍යාපෘති කවරේද;

(iii) එලෙස අවසන් කර ඇති ව්‍යාපෘති සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම ව්‍යාපෘති සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2024.12.19 දිනැති අංක 2415/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විස්තර කර ඇති I සිට IX දක්වාවූ එක් එක් කාර්යයේ මේ වනවිට ප්‍රගතිය සහ ඒ සඳහා වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1930/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 අංක 43 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත මඟින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9(අ) වගන්තිය සංශෝධනය කර පැමිණිලිකරුගේ පදිංචිය මත පදනම්ව දිසා අධිකරණයේ නඩු පැවරීම සඳහා හැකියාව ලබාදීම නුසුදුසු බවත්;

(ii) ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් එම 9(අ) වගන්තිය සංශෝධනය කර නීතිය පෙර පැවති තත්ත්වයට පත් කළ යුතු බවට ඉල්ලීමක් කර ඇති බවත්;

(iii) එම සංශෝධනය කඩිනමින් සිදු කරන බවට පාර්ලිමේන්තුව අමතමින් අවස්ථා කිහිපයකදී ප්‍රකාශ කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 මැයි 05 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

107/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ ලාභය හෝ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අලාභ ලබා තිබේ නම්, ඊ සඳහා බලපෑ හේතු කවරේද;

(iii) විදුලිබල මණ්ඩලය මේ වනවිට ලාභ ලබන්නේ නම්, එමඟින් විදුලි පාරිභෝගිකයන්ට යම් සහනයක් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා විදුලිබල මණ්ඩලය විසින් සමාගම්වලට ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම සමාගම් සමඟ ඇති කර ගත් ගිවිසුම් සම්බන්ධයෙන් සමාලෝචනයක් හෝ ඇගයීමක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, ඊ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ස්ථාවරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඊ මන්ද?

233/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාතේ සිවිල් අභියාචනා බලය ක්‍රියාත්මක කරනු ලබන පළාත්බද මහාධිකරණයක්, පානදුර අධිකරණ පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට නිර්දේශ කර ඇති බව දන්නේද;

(ii) එම නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) පානදුර, 'සිවිල් අභියාචනා මහාධිකරණය' හැකි ඉක්මනින් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඊ මන්ද?

361/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ද ෆිනෑන්ස් ආයතනය' ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඉල්ලා ඇති බව 2021.02.10 දින පාර්ලිමේන්තුවේදී එවකට විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයා ප්‍රකාශ කළ බව දන්නේද;

(ii) එම අනුමැතිය ලබා දුන් දිනය සහ සුදුසු ආයෝජකයෙක් කැඳවූ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය ඇවර කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව 2021.02.15 දින වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කළ බවත්;

(ii) එය ඉහත ප්‍රකාශයට පටහැනි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙන් අගතියට පත් එක් තැන්පත්කරුවෙකුට රු.500,000/- බැගින් ගෙවනු ලබන දිනය කවරේද;

(ii) ඉහත අරමුදලේ මුදල් භාවිතයෙන් තැන්පත්කරුවන්ගේ සම්පූර්ණ මුදල ගෙවිය හැකිද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) 2019 ජනවාරි මස විශේෂ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය මසකට රුපියල් බිලියනයක් වන ක්‍රමය යටතේ මහ බැංකුව විසින් රුපියල් මිලියන 950කට අධික මුදලක් උපයාගැනීම සඳහා ‘ද ෆිනෑන්ස් ආයතනයට’ ඉඩ ලබාදී, පසුව බලපත්‍රය අවලංගු කළ බව දන්නේද;

(v) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

467/2025

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ලියාපදිංචි තරු පන්තියේ හෝටල් සංඛ්‍යාව, ක්‍රියාත්මක වර්ෂ, කාමර ධාරිතාවය, ඍජු හා වක්‍ර සේවකයින් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(ii) එම කාලය සඳහා Airbnbහි ලියාපදිංචි වෙබ් අඩවි සංඛ්‍යාව කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා සංචාරකයින්ගේ පැමිණීම, මුළු ඉපැයීම සහ ඒක පුද්ගල ඉපැයීම කොපමණද;

(iv) ක්‍රියාත්මකව පවතින Booking.com ආයතන සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් උපයා ගත් මුදල සහ ගෙවූ බදු මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සංචාරකයින් නැවතී සිටින සාමාන්‍ය කාලසීමාව කොපමණද;

(ii) වාර්ෂිකව නැවත පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2020 වර්ෂයේ සිට මේ දක්වා සිංගප්පූරුව, තායිලන්තය, ජපානය, ඇමරිකාව, චීනය, එක්සත් රාජධානිය, මැලේසියාව, ඩුබායි, ඉන්දියාව, තුර්කිය, ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව, වියට්නාමය, ප්‍රංශය සහ කැනඩාව යන රටවලින් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සංචාරක කර්මාන්තයේ පවතින දුර්වලතා කවරේද;

(ii) එමඟින් ඇති වන අහිතකර බලපෑම් කවරේද;

(iii) එම දුර්වලතා අවම කිරීමට ගත් පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

568/2025

ගරු රෝහණ බංඩාර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂය වනවිට ලංකා විදුලිබල මණ්ඩලය විසින් රජයේ බැංකුවලින් ණය ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම බැංකුවල නම් කවරේද;

(iii) එම ණයවලින් මේ වනවිට ගෙවීමට ඇති ණය මුදල කොපමණද;

(iv) විදුලිබල මණ්ඩලය විසින් බැංකුවලින් ණය ගැනීම අවම කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

642/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.02.09 දින මුළු ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි විදුලිය ඇන හිටීමක් සිදුවූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශයෙන් සහ ලංකා විදුලිබල මණ්ඩලයෙන් පත් කරන ලද කමිටු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් කමිටුවේ සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම කමිටු වාර්තා මඟින් අනාවරණයවූ කරුණු කවරේද;

(v) එම විදුලිය ඇන හිටීමට සෘජුව වගකිව යුතු නිලධාරීන්ගේ නම් හා තනතුරු නාම කවරේද;

(vi) ඉහත කමිටු වාර්තා මඟින් අනාවරණයවූ කරුණු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1176/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන කථානායකවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව, ඔවුන්ගේ නිල නාමයන් සහ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) කථානායකවරයාගේ නිල නිවස ලෙස 'කථානායක නිල නිවස' භාවිත කරන්නේද;

(iii) එකී නිල නිවස සඳහා කථානායකවරයා විසින් පත් කරගෙන තිබෙන සේවක සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, තනතුරු සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කථානායකවරයාගේ සහ කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා ලබාදී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවල අංක, වර්ගය සහ මාසික ඉන්ධන කෝටාවන් වාහන අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම වාහන සඳහා ඉන්ධන සපයා ගනු ලබන්නේ කෙසේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කොළඹ 04, ලෝරිස් පටුමගෙහි පිහිටි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අයත් මහල් නිවාස සංකීර්ණයෙහි කථානායකවරයා විසින් නිවසක් භාවිත කර තිබේද;

(ii) මේ වනවිටත් එම නිවස භාවිත කරන්නේද;

(iii) එම නිවසේ කුලිය, විදුලි බිල්පත් සහ ජල බිල්පත් සඳහා ගෙවීම් සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 03 තුළ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) එම ශිෂ්‍යයන් අතරින් අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව;

(iii) ඉහත (i) සහ (ii) හි සඳහන් ශිෂ්‍ය සංඛ්‍යාව, අදාළ වසරවලදී ප්‍රාථමික අංශයට ඇතුළත්වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1935/2026

ගරු අජිත් ගිහාන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය රට තුළ තිබෙන මිරිදිය ධීවර, ඉස්සන් සහ විසිතුරු මසුන් කර්මාන්ත සඳහා වගකීම් දරන ආයතනය බව දන්නේද;

(ii) එසේ නම්, එම ආයතනය විසින් පසුගිය පාලන කාලයන් තුළ ඉහත ක්ෂේත්‍රවල අවශ්‍යතාවයන් අනුව පහසුකම් සලසාදී තිබේද;

(iii) අධිකාරිය සතු මත්ස්‍ය සහ ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) මෙරට වගා කටයුතු සඳහා ප්‍රමාණවත් මත්ස්‍ය සහ ඉස්සන් පැටවුන් ලබාදීමට අධිකාරියට හැකියාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අධිකාරිය තුළ පසුගිය කාලයේ මූල්‍ය වංචා සිදුවී තිබේද;

(ii) අධිකාරිය සතුව ජලජීවී වගා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1947/2026

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 ජනවාරි 01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය ලබා ඇති සම්පූර්ණ අලාභය කොපමණද;

(ii) ඒ අතරින් මෙහෙයුම් අලාභය කොපමණද;

(iii) එම ආයතනය විසින් ගුවන්යානා සඳහා ගෙවනු ලබන වාර්ෂික ලීසිං වාරිකය/ණය වාරිකය කොපමණද;

(iv) එම ලීසිං වාරිකය/ණය වාරිකය ගෙවනු ලබන ගුවන්යානා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය විසින් ලබා ගෙන ඇති මුළු ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය වෙනුවෙන් වාර්ෂිකව ගෙවිය යුතු මුළු ණය වාරිකය කොපමණද;

(iii) එම ණය වාරිකයේ ඇති වාරිකය, ප්‍රාග්ධන මුදල හා පොළී මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

**2026 මැයි 06 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

885/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නිත්‍යානුකූලව ඉවත්කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1033/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලග්ගල බස් නැවතුම්පොළ පිහිටුවන ලද දිනය කවරේද;

(ii) එම බස් නැවතුම්පොළ ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එහි ප්‍රමාණවත් පහසුකම් නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1247/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සියලුම ආර්ථික මධ්‍යස්ථාන ඒකාබද්ධ කර පෞද්ගලික සමාගමක් ස්ථාපිත කිරීමට සූදානමක් තිබේද;

(ii) එසේ නම්, එම සමාගම ස්ථාපිත කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එම සමාගමේ ව්‍යුහය කවරේද;

(iv) එම සමාගම ස්ථාපිත කිරීමෙන් ලැබෙන වාසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1374/2025

ගරු නිතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම ග්‍රාමයේ ජීවත් වන ජනතාව මේ වනවිට උග්‍ර පානීය ජල ගැටලුවකට මුහුණදී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1763/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂයේ අයවැය මඟින් තේ කර්මාන්තයේ සංවර්ධනය සහ නගා සිටුවීම සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) එම මුලු ප්‍රතිපාදනයෙන් එක් එක් පළාත අනුව වෙන් කරන ලද ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නුවරඑළිය, බදුල්ල, මාතලේ, රත්නපුර, ගාල්ල සහ මාතර යන එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිපාදන නව වගා සහ නැවත වගා කිරීම, කර්මාන්තශාලා නවීකරණය සහ තාක්ෂණික දියුණුව, පර්යේෂණ සහ තේ වගා ප්‍රවර්ධනය, අලෙවිකරණය සහ වෙළඳපොළ ප්‍රවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන්ට සහනාධාර දීම සහ වෙනත් අදාළ අංශ අනුව යොදා ගැනීමට සැලසුම් කරන ලද ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2026 වර්ෂයේ අයවැය මඟින් තේ කර්මාන්තය සඳහා වෙන් කරන ලද මුලු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 මැයි 07 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

765/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව, එම සිද්ධිය සම්බන්ධයෙන් ආරම්භ කළ විමර්ශන කටයුතු සඳහා මුල් අවස්ථාවලදී සම්බන්ධවූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් අතරින්, පසුව එම විමර්ශනවලින් ඉවත් කළ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එලෙස නිලධාරීන් විමර්ශන කටයුතුවලින් ඉවත් කිරීමට හේතු කවරේද;

(iv) ඉහත (ii)හි සඳහන් නිලධාරීන් විමර්ශන කටයුතු සඳහා නැවත සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

815/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිවී ගෘහ සේවිකාවන් ලෙස විදේශ ගතවූ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන්ගේ තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දත්ත පද්ධතියට ඇතුළත් කර තිබේද;

(iv) ඔවුන් අතරින් මියගිය, සිය දිවි නසා ගත් සහ වෙනත් අනතුරු හේතුවෙන් පීඩාවට පත්වී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඔවුන්ගේ සුභසාධනය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

840/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොරටුව, ධර්මරතන විද්‍යාලය, ලක්ෂපතිය ශික්ෂාදාන විද්‍යාලය සහ සුනන්දෝපනන්ද ප්‍රාථමික විද්‍යාලය යන පාසල්වල මේ වනවිට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම පාසල් වැසී යන තත්ත්වයකට පත්වී තිබෙන බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1016/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ තුන (03) තුළ කාන්තාවන්ට එරෙහි සයිබර් අපරාධ සම්බන්ධයෙන් විසඳා ඇති නඩු සංඛ්‍යාව සහ විමර්ශන සිදු කෙරෙමින් පවතින හෝ නඩු පැවරීමට නියමිත සයිබර් අපරාධ සිද්ධීන් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එවැනි නඩු විසඳීම සඳහා සාමාන්‍යයෙන් ගතවන කාලය කොපමණද;

(iii) උතුරු පළාත ඇතුළුව සෑම පළාතකම එවැනි නඩු විභාග කිරීම සඳහා විශේෂිත සයිබර් අපරාධ ඒකක ස්ථාපිත කර තිබේද;

(iv) කෘත්‍රිම බුද්ධිය (AI) පදනම් කර ගත් අධීක්ෂණ පද්ධති, මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ දැඩි බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළුව කාන්තාවන් සඳහා ඩිජිටල් ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එලෙස ගනු ලැබූ පියවර පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1188/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් කෘෂි ගොවිපොළ පවත්වාගෙන යනු ලබන බව දන්නේද;

(ii) එම ගොවිපොළ පිහිටි ස්ථානය එක් එක් දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගොවිපොළවල විශාලත්වය සහ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයට ආරක්ෂක අංශවල මැදිහත්වීමක් පවතින බව දන්නේද;

(ii) හමුදාවේ මැදිහත්වීමෙන් පවත්වාගෙන යනු ලබන මෙවැනි ගොවිපොළ අතරින්, උතුරු පළාත් සභාවට පවරා දිය යුතු ගොවිපොළවල් මෙතෙක් පවරා නොදීමට හේතු කවරේද;

(iii) අදාළ ගොවිපොළවල් පවරා දීමට කටයුතු කරනු ලබන කාලවකවානුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1337/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20හි සේවය කරනු ලබන ක්‍රීඩා නිලධාරින්ගේ නම් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දීර්ඝ කාලයක සිට එම දිස්ත්‍රික්කයේ ක්‍රීඩා නිලධාරි තනතුරේ පුරප්පාඩු 13ක් පවතින බව දන්නේද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය සිට පානම දක්වා සිංහල ජනතාව වැඩි වශයෙන් ජීවත්වන ප්‍රදේශ සඳහා දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියෙක් (සිංහල) සහ දෙමළ ජනතාව වැඩි වශයෙන් ජීවත්වන ප්‍රදේශ සඳහා දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියෙක් (දෙමළ) පත්කර තිබූ නමුත් මේ වනවිට දෙමළ දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියෙක් නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රදේශ සඳහා දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියෙක් (දෙමළ) පත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1457/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කයන්හි තැපැල් කාර්යාල සඳහා අනුමත, මේ වනවිට සේවය කරන සහ පුරප්පාඩු පවතින සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත සේවක පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) මේ වනවිට ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාල ස්ථාපිත කර නොමැති දිස්ත්‍රික්ක කවරේද;

(iv) වව්නියාවේ පවත්වාගෙන යනු ලබන මුලතිව් දිස්ත්‍රික්කයට අයත් තැපැල් අධිකාරි කාර්යාලය නැවතත් මුලතිව් හි ස්ථාපිත කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තැපැල් බෙදා හැරීමේ කටයුතු සඳහා මේ වනවිට වාහන පහසුකම් නොමැති දිස්ත්‍රික්ක කවරේද;

(ii) කාර්යක්ෂම තැපැල් සේවාවක් ලබාදීම පිණිස ඉහත දිස්ත්‍රික්ක සඳහා වාහන/ප්‍රවාහන පහසුකම් ලබාදීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1471/2025

ගරු චානක මාදුගොඩ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිවල, ජාතික සත්වෝද්‍යානයේ කැළි කසල බැහැර කිරීම විධිමත් පරිදි සිදු නොවන බව දන්නේද;

(ii) සත්වෝද්‍යානය නරඹන්නන්ට ආහාර ගැනීම සඳහා මේ වනවිට පවතින ස්ථාන ඒ සඳහා සුදුසු යැයි පිළිගන්නේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා නිසි ස්ථානයක් ඉදිකිරීමට අපේක්ෂා කරන්නේද;

(iv) සත්වෝද්‍යානයේ මාසික ආදායම සහ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සත්වෝද්‍යානයේ ඉදිරියේදී සිදු කිරීමට නියමිත නවීකරණ කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1823/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු කවරේද;

(iv) එම ව්‍යාපෘති අතරින් ජනතාවට ජලය සපයන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(v) එම ජල ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ ලබන ප්‍රදේශ කවරේද;

(vi) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින ජල සැපයුම් ව්‍යාපෘති තිබේද;

(vii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(viii) එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

(ix) එම ක්‍රියාත්මක නොවන ව්‍යාපෘතීන් සක්‍රිය මට්ටමට ගෙන ඒම සඳහා කටයුතු කරන්නේද;

(x) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1854/2026

ගරු රොෂාන් අක්මීමන මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර සහ කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ධාන්‍යගම ප්‍රදේශයේ, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් නිවාස සංකීර්ණයක් තිබෙන බවත්;

(ii) එම නිවාස සංකීර්ණය නිසි පරිදි පරිපාලනය නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස සංකීර්ණයේ මේ වනවිට පවතින නිවාස ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ලබාදීමේ ක්‍රමවේදය සහ නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 මැයි 08 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

27/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෑම ප්‍රාදේශීය සභාවක් සතුවම එහි දේපළ පිළිබඳ නිශ්චිත ලේඛනයක් තිබිය යුතු බවත්;

(ii) බොහෝ ප්‍රාදේශීය සභා සතුව එවැනි ලේඛනයක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1543/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට සිට සීපෝත්, නාගස්තැන්න හරහා නාවලපිටිය දක්වා ඇති මාර්ගය වර්ෂ 20ක පමණ කාලයක සිට පිළිසකර නොකිරීමට හේතු කවරේද;

(ii) කොළඹ සිට නාවලපිටිය දක්වා විකල්ප මාර්ගයක් ලෙස ඉහත මාර්ගය භාවිත කළ හැකි බව දන්නේද;

(iii) ඉහත මාර්ගයේ කිලෝ මීටර් 9 සිට සංවර්ධනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කර තිබුණේද;

(iv) ඒ සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(v) එම සංවර්ධන කටයුතු නිසි ලෙස සිදු කර තිබේද;

(vi) එහිදී නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර තිබේද;

(vii) ඉහත මාර්ගයේ සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1642/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට ,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගන සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉදිරියේදී නව ක්‍රිකට් ක්‍රීඩාංගන ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රීඩාංගන ඉදිකිරීමට නියමිත ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයන් සිටින බව දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ව හඳුනාගෙන ජාතික කණ්ඩායමට ඇතුළත් කර ගැනීම සඳහා තිබෙන වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1756/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන්ට ඉඩම් ලබාදීම සහ එම ඉඩම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා 2008/4 චක්‍රලේඛය ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එසේ නම්, එම චක්‍රලේඛය යටතේ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අදියර 1,2,3,4 සහ 5 යටතේ අයදුම් කළ තැනැත්තන්ගේ සංඛ්‍යාව සහ නිකුත් කර ඇති නව ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව අදියර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත චක්‍රලේඛයට අනුව පසුගිය වසර 17ක කාලය තුළ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නිකුත් කර ඇති මුළු නව බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) එම චක්‍රලේඛය යටතේ අයදුම් කර ඇති, එහෙත් මෙතෙක් නිකුත් කර නොමැති ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(v) නැගෙනහිර පළාත් ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කර ඇති නමුත්, මෙතෙක් නිකුත් කර නොමැති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(vi) එම ඉඩම් බලපත්‍ර නිකුත් නොකර රඳවා තබා ගැනීමට බලපා ඇති හේතු කවරේද;

(vii) අදාළ බලපත්‍ර සුදුස්සන්ට ඉතා කඩිනමින් නිකුත් කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1786/2025

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති වාහන සංඛ්‍යාව එක් එක් වාහන කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වාහන දුම් පරීක්ෂාව සිදු කරන ආයතනවලින් වාර්ෂිකව රජයට ලැබෙන ආදායම එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රථ වාහන තදබදය අවම කිරීම සඳහා සිදු කර ඇති ඉදිරි සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1790/2025

ගරු බී. ආරියවංශ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වල ඇති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පුරප්පාඩු පිරවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1831/2026

ගරු කන්දසාමි ප්‍රභු මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයට අදාළව 2025/2026 වසර සඳහා යෝජනාවී ඇති කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත කලාපයේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ මඩකලපුව ශාඛාව හරහා මෙම වසර තුළ කාර්මික පුහුණුව ලැබූ දේශීය ව්‍යවසායකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) මඩකලපුව දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍යම පරිමාණ අත්යන්ත්‍ර කර්මාන්ත සඳහා වෙළඳපොළ අවස්ථා පහසු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා ලබාදී ඇති අඩු පොලී ණයවල සමස්ත වටිනාකම කොපමණද;

(v) නැගෙනහිර පළාතේ කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා විශේෂිත බදු සහන ලබා දීමට කටයුතු කර තිබේද;

(vi) මඩකලපුව දිස්ත්‍රික්කයේ අපහසුතාවයන්ට ලක්වී සිටින ව්‍යවසායකයින් සඳහාවූ 'SME ඇපකර අරමුදල' හි වර්තමාන ප්‍රගතිය කවරේද;

(vii) එම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ඇසුරුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සැලසුමක් තිබේද;

(viii) ආනයනික විකල්පවලින් දේශීය කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1906/2026

ගරු ආර්.ජී. විජේරත්න මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේමළුව ග්‍රාම නිලධාරි වසමේ පවුල් 43ක් පදිංචිවී සිටින ප්‍රදේශය පුරාවිද්‍යා සංරක්ෂිත කලාපයක් ලෙස ගැසට් කර ඇති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයට බාධා සිදුවී ඇති බව පිළිගන්නේද;

(iii) එම ඉඩම් සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ඔප්පු ලබා දීම ප්‍රමාදවී ඇත්තේ, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව නොමැති වීම හේතුවෙන් බව දන්නේද;

(iv) මෙම කාරණය සම්බන්ධයෙන් යම් සහනදායි පියවරක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1920/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංගම්පිටිය මාර්ගය, ඇතුල්කෝට්ටේ සහ පාසල් මාවත, රාජගිරිය, නාවලදී සම්බන්ධ කරමින් රාජගිරිය, නාවල ඇළ හරහා නව පාලමක් ඉදිකිරීමට කටයුතු කරන බව දන්නේද;

(ii) එම පාලම ඉදිකරන ප්‍රදේශය ජෛව විවිධත්වය සහ පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතා සංවේදී කලාපයක් බව දන්නේද;

(iii) එසේ නම්, එම පාලම ඉදිකිරීම සඳහා අවශ්‍ය පාරිසරික, රථ වාහන තදබදය, සමාජ-ආර්ථික සහ පුරාවිද්‍යාත්මක බලපෑම් වාර්තා ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1940/2026

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) එම ව්‍යාපෘති ආරම්භ කිරීමේදී රජයේ මැදිහත්වීම හා ග්‍රාමීය ප්‍රජා දායකත්වය කවරේද;

(iii) එම ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන ප්‍රජා ජල කමිටුවල/සමිතිවල ව්‍යුහය හා වගකීම කවරේද;

(iv) එම ව්‍යාපෘති සඳහා රජයේ ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන මැදිහත්වීම සඳහා ක්‍රමවේදයක් තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රජා ජල ව්‍යාපෘති නියාමනය හා විගණනය කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) මේ දක්වා සිදු කරන ලද විගණනවලින් අනාවරණයවූ කරුණු සම්බන්ධයෙන් පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා.111/2026

ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු බී. ආරියවංශ මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු නයන වාසලතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතාට එරෙහි විශ්වාස භංගත්වය,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය III වැනි කොටසේ, 6 වගන්තියෙහි:

"මන්ත්‍රීවරයන් සෑම අවස්ථාවක දී ම ඔවුන් වෙත තබා ඇති මහජන විශ්වාසයට අනුව ක්‍රියා කළ යුතු අතර, සෑම විට ම යම් පොදු සම්පත් භාවිතය ද ඇතුළු ඔවුන්ගේ හැසිරීම අවංකභාවයකින් සහ ඒකානුතාවයකින් විය යුතු ය."

යනුවෙන් සඳහන් කර ඇතත්, එය කඩ කර ඇති හෙයින්ද;

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ V වැනි කොටසේ 9 වගන්තියෙහි චර්යා රීතිවල සඳහන්:

"(අ) හෘද සාක්ෂියට එකඟව කටයුතු කිරීම.
(ඇ) ජනතාවගේ විශ්වාසය සහ ගෞරවයට යෝග්‍ය වන පරිදි කටයුතු කිරීම.
(ඉ) තමන් වගකිව යුතු චර්යාව සහ කාර්යභාරය සම්බන්ධයෙන් වගකිව යුතු වීම."

යන චර්යා රීති උල්ලංඝනය කර ඇති බව බැලූ බැල්මටම තහවුරු වන හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 ව්‍යවස්ථාවට අනුකූලව මූලික යුතුකම් ඉටු කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස අපොහොසත් වන බව නිරීක්ෂණය වන හෙයින්ද;

නොරොච්චෝලේ, ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා ප්‍රමාණවත් හා ගුණාත්මක ගල් අඟුරු ප්‍රසම්පාදනය සහතික කිරීම සඳහා බලශක්ති අමාත්‍යවරයා තම මූලික රාජකාරිය ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව සනාථ වන හෙයින්ද;

තීරණාත්මක ජාතික බලශක්ති වත්කමක් අධීක්ෂණය කිරීමේදී එවැනි දැඩි නොසැලකිලිමත්කමක් අමාත්‍ය වගකීම මූලික වශයෙන් උල්ලංඝනය කිරීමක් වන හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් බලශක්ති අමාත්‍යවරයාට පවරා ඇති ආයතනික කළමනාකරණ මට්ටමින් සිදුවන පාඩු සහ විදුලි ජනන හා බෙදාහැරීමේ පද්ධතියට සිදුවන තාක්ෂණික හානි අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම යන විෂයයන් හා කාර්යයන් ඉටුකිරීම පැහැර හැරීම සිදුකර ඇති හෙයින්ද;

වර්තමාන බලශක්ති අමාත්‍යවරයා, ලංකා පොහොර සමාගමේ ප්‍රසම්පාදන කළමනාකරු ලෙස සේවය කරමින් සිටියදී දූෂණ ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් ඔහුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් (26 වැනි අධිකාරය වූ) අල්ලස් පනතේ 70 වගන්තිය ප්‍රකාරව "දූෂණය වරද" පිළිබඳ චෝදනා කර කොළඹ මහාධිකරණය හමුවේ විධිමත් අධිචෝදනා ගොනු කර ඇති හෙයින්ද; සහ

ඉහත සඳහන් කළ කරුණු අනුව රාජ්‍ය මූල්‍ය පාඩුව, ජාතික බලශක්ති ආරක්ෂාව අනතුරේ හෙළීම, දූෂිත ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලිය හැසිරවීම, "දූෂණය වරද" සඳහා ක්‍රියාකාරී අධිකරණ ක්‍රියාමාර්ගයන්ට ලක් වීම සහ රජයේ "දූෂණ විරෝධී ජනවරම" පාවාදීම තුළින් බලශක්ති අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාවගේ විශ්වාසය ආපසු හැරවිය නොහැකි ලෙස අහිමි කර ගෙන ඇති බව සහ ඔහු දිගින් දිගටම බලශක්ති අමාත්‍ය ධුරයේ රැඳී සිටීම මහජන යහපතට, නීතියේ ආධිපත්‍යයට සහ යහපාලන මූලධර්මවලට පටහැනි හෙයින්;

බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතාට තවදුරටත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.